"ඔන්ලයින් අධ්‍යාපනයට දුන් හලෝ් එකෙන් පහළොවේ දැරිය මල් හී විදගෙන" යන සිරස්තලය සමඟින් අරුණ පුවත්පත (8/11) වාර්තා කර තිබුණේ, "බාලවයස්කාර දියණියක් ප්‍රේම සම්බන්ධයක් මත පෙම්වතා සමග නිවසින් පලා ගිය" බවට වන පුවතකි.

මෙම පුවත් සිරස්තලය සහ අන්තර්ගතය අනුව,

1) දෙමාපිය අනුදැනුම නොමැතිව බාලවයස්කාර දැරියක් දෙමාපිය භාරකාරත්වයෙන් රැගෙන යෑම වරදක් නොවන්නේද? එය ප්‍රේම සම්බන්ධතාවයක් වුවත්, වයස අවුරුදු 16 ට අඩු බාලවයස්කාර දැරියකට එවැනි තීරණ ගැනීමට නෛතික හැකියාවක් නැති බව සැලකූ විට, එය නීතිය ඉදිරියේද වරදක් නොවනු ඇති ද?

2) එසේ නම්, මෙම පුවත් වාර්තාව සහ සිරස්තලය තුළ, එම සිදුවීම ලඝු කොට දැක්වී නැතැයි ඔබ සිතන්නේ ද?

3) "ඔන්ලයින් අධ්‍යාපනයට දුන් හලෝ් එකෙන් පහළොවේ දැරිය මල් හී විදගෙන" යන සිරස්තලය සමගින්, මෙම බාලවයස්කාර දැරිය වෙත සිදුවීමේ වගකීම සහ දෝෂාරෝපණය පැවරීමක් සිදුව ඇතැයි ඔබ නොසිතන්නේ ද? මෙම පුවත් වාර්තාව තුළින්, ඇයව රැගෙන ගිය තරුණයා වෙත සිදුවීමේ වගකීම පැවරී නොමැත්තේ මන්ද?

ඒ අනුව, මෙම පුවත් වාර්තාව පිළිබඳ ඔබේ අදහස් මොනවාද?